**බදුල්ල අධ්‍යාපන කලාපය**

# සිංහල භාෂාව හා සාහිත්‍යය තරගාවලිය. 2018

11 ශ්‍රේණිය

**සාහිත්‍ය දැනුම මිනුම**

නම :-............................................................................................................ කාලය :- පැය 03 යි.

පාසල :-.............................................................................................. පාසල් වර්ගය :- 200 තෙක් / 201-500 තෙක් /500 ට වැඩි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01). පහත දැක්වෙන පාඨ (අ) උපුටාගත් පාඩමේ නම (ආ) කිවේ කවුරුන් විසින් ද? (ඉ) කීවේ කවරකු හට ද? (ඊ) කුමන අවස්ථාවක දී ද? යන කරුණු ලියන්න.

1. " මගේ මිනිහා ඒකේ ඇතුලේ වෙන්ඩ ඇති "

(අ).....................................................................................................
(ආ).....................................................................................................
(ඉ).....................................................................................................
(ඊ).....................................................................................................

11. " ඔහු කෙරෙහි ඇති වූ ප්‍රේමය නිසා මම රජ සැප හැර දමා මේ වනයෙහි වෙසෙමි දරුවනි "

(අ).....................................................................................................
(ආ).....................................................................................................
(ඉ).....................................................................................................
(ඊ).....................................................................................................

111. " මහ රජ නො බව මගේ ගෙහි කුමරෙක් උපන "

(අ).....................................................................................................
(ආ).....................................................................................................
(ඉ).....................................................................................................
(ඊ).....................................................................................................

1v. " පුත, තෙල ලෙස කිරීම තොපටත් අපටත් තරම් නො වෙයි "

(අ).....................................................................................................
(ආ).....................................................................................................
(ඉ).....................................................................................................
(ඊ)..................................................................................................... (ලකුණු. 5×4= 20)

(02). පහත සඳහන් කවිවල ඉතිරි පද සම්පූර්ණ කරන්න.

1. මන් මත් කරවන දන මුළු දෙරණා

.........................................................................................

සවනොත් සඳ පුරඟන ලොබ දිවුණා

.........................................................................................

11. සිනිඳු වස්ත්‍ර මිණි අබරණ

තුමුල මාලිගා

.........................................................................................

.........................................................................................

111. ..........................................................................................

..........................................................................................

සුනදර සුරඹුන්ගේ අතේ

නැළවෙන බව සිතනු පුතේ

1V. දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතුය

එහිත් සුවඳ මල් නිතිවෙයි මිණි මුතුය

..........................................................................................

..........................................................................................

v. පටන් සුරිඳු දුන් උපදෙස් සිහි කොට

..........................................................................................

තුටන් වඩන සුර අඟනෝ බැස සිට

.......................................................................................... (ලකුණු 5×4= 20)

(03). පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. බැද්දේගම නවකතාව කිනම් නවකතාවක පරිවර්තනයක් ද ?

11. බැද්දේගම නවකතාවේ කතුවරයා කවුද ?

111.මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පංතිය ඇතුළත් මුල් කෘතිය නම් කරන්න.

1v. " ගුත්තිල වෙණ නද " පාඩම ඇතුළත් මුල් කෘතියේ කතුවරයාගේ නම ලියන්න.

v. උග්ගසේන සිටුපුත්‍රයාගේ කතාවේ අතීත කතාවෙන් දෙන පණිවිඩය කුමක් ද ?

v1. එම කතා වස්තුව උපුටාගත් ග්‍රන්ථය කුමක් ද ?

v11. පහත කෘතිවල කතුවරු නම් කරන්න.

(අ) කව් ලකුණු මිණිමල
(ආ) පිං ඇති සරසවි වරමක් දෙන්නේ

v111. සන්දේශ කාව්‍ය ඉතිහාසයේ සඳහන් පළමුවන කාව්‍ය නම් කරන්න.

1x. ප්‍රේමති ජායති ශෝකෝ නාට්‍ය රචනා කළ කතුවරයා කවරෙක් ද ?

x . සද්ධර්මරත්නාවලිය රචනා කළේ කවුද ?

(ලකුණු 2×10= 20)

(04). පහත පද්‍ය කියවා ඔබට ඇතිවන හැඟීම් වචන 150කින් පමණ ලියන්න.

ජම්බු ගස් පෙර පරිදි යළිත් බර වී දිලේ
කුඹුක් ගස් සෙවණ දෙයි ළිඳට අත් ඔසවමින්
මල්ලි හා එක්ව නැටූ අඩිපාර මෙය තමා
මතක පිරී මේ නිවස දැන් අපට අයිති නැත

ගේට්ටුව අසල නාමල් සදයි සුදු රටා
බුදු පුදට මෑණියන් මල් නෙලූ වැට මෙයයි
පෙර පරිදි කබරයෙක් ලියද්දට ඇදී යයි
මතක පිරී මේ නිවස දැන් අපට අයිති නැත

නිවස පිටිපස ලියැදි හිරු රැසින් පිබිද ඇත
එකල මෙන් අදත් පල්කඩ වෙලේ සුවඳ ඇත
ආලින්දයෙහි පෙනේ අලුත් පුටු පේළියක්
මතක පිරී මේ නිවස දැන් අපට අයිති නැත

තාත්තා වැතිර සිටි දිග පුටුව නොමැත එහි
බුලත් වැල් කෝමාරිකා පඳුරු මැරී ඇත
දහසක් නෙක පැතුම් මැද කල්ගෙවූ නිවස මෙන්
මතක පිරී මේ නිවස දැන් අපට අයිති නැත

( ලකුණු = 10 )

(05). තම සිතැඟි කෙසේ හෝ මුදුන් පමුණුවා ගැනීමට යත්න දරන ආත්මාර්ථකාමී පුතෙකුගේ චරිත ලක්ෂණ සිංහබාහු චරිතයෙන් මෙන් ම සාම්ප්‍රදායික කාන්තාවකගේ චරිත ලක්ෂණ සිංහසීවලි චරිතයෙන් මැනවින් ඉස්මතු වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

( ලකුණු = 15 )

(06). අමාවතුර කෘතියෙහි සඳහන් ආකාරයට අහිංසක දරුණු මිනිමරුවෙකු බවට හේතු වූයේ ගුරුවරයාගේ අදූරදර්ශීබව හා මිතුරන්ගේ ක්‍රියා කලාපයයි. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් මෙම කියමන පැහැදිලි කරන්න.

( ලකුණු = 15 )